ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024

06 වන මට්ටම

LLU 6813 නීති විද්‍යාව

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය- I

කාලය පැය 01 යි

---

**දිනය : 2024 නොවැම්බර් 08** **වේලාව: ප.ව 1.30 - ප.ව 2.30**

---

පහත ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. යුද බිමකදී, රණශූරයා සිය ප්‍රතිවිරුද්ධ ගෝත්‍රයේ මරණාසන්න සොල්දාදුවෙක් වෙත ලගාවේ. එහිදී ඔවුන් දෙදෙනා පහත සංවාදයේ නිරත වේ.

සොල්දාදුවා : "මා කළ සියලු යහපත් දේ තිබියදීත් , මාගේ වරද කුමක්ද ? මම සැමවිටම සදාචාරයේ මාර්ගය අනුගමනය කළෙමි. මම සැමවිටම මාගේ බැදීම් මෙන්ම මා විසින් දුන්, පොරොන්දු සුරක්ෂා කළෙමි. මාගේ ගෝත්‍රයේ නායකයාට සහාය දීම වරදක් බවද දනිමි. එය කරණ කොට ගෙනම, මම මරණ මංචකයෙහි වැතිර සිටිමි. රණ ශූරයාණෙනි, මාගේ වරද කුමක්ද ? "

රණශූරයා : "සැමවිටම ඔබේ පොරොන්දු ආරක්ෂා කරන ලෙස සදාචාරය පවසයි'. 'ඔබට ප්‍රස්තුත වන්නේ වර්තමානය පමණක් මිස අනාගතයේ දේවල් සිදුවන ආකාරය ඔබට විෂය නොවන බැවින්, ප්‍රඥාව පවසන්නේ කිසිවිටෙක පොරොන්දු ලබා නොදෙන ලෙසය. '

සදාචාරය මත පිහිටා එළඹෙන ලද පොරොන්දුවක් මගින් සමාජයට හානියක් ඇතිවන කල්හි එය බිද දැමීමට යමෙක් උගත යුතුය. නමුත් ඔබ සදාචාරය තුළ සිරගතව සිටියේය. සදාචාරය ඔබව බැද තබන නමුත්, ප්‍රඥාව සහ තර්කනය ඔබව නිදහස් කරයි. ඔබ තෝරා ගත යුතුව පැවතියේ, ප්‍රඥාවේ සහ තර්කනයේ මාර්ගය මිස සදාචාරය නොවේ. "

ස්වභාවික නීති විද්‍යා ගුරුකුලයෙහි චින්තනයේ පරිණාමය ඉහත සංවාදය ඇසුරින් විශ්ලේෂණය කරන්න. සුදුසු උදාහරණ ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න.

**( ලකුණු 20 යි )**

*** හිමිකම් ඇවිරිණි ***